# මුදල් හා ප්‍රතිපත්ති සැකසීමේ කාරක සභා රැස්වීම් වාර්තාව

2025.08.29 වන දින ප.ව. 01.30 ට ගරු සභාපතිතුමාගේ ප්‍රධානත්වයෙන් ප්‍රධාන කාර්යාලයේ රැස්වීම් ශාලාවේදී පැවති මුදල් හා ප්‍රතිපත්ති සැකසීමේ කාරකසභා රැස්වීමේදී ගරු සභාපතිතුමා විසින් කාරකසභා සාමාජිකයන් පිළිගැනීමෙන් අනතුරුව කාරකසභා අනුමැතිය ලබාගැනීම සඳහා විෂයභාර නිලධාරීන්, බාහිර ආයතන හා පුද්ගලයන් විසින් ඉදිරිපත් කල ගෙවීම් වවුචර්පත් හා ලිපි ලේඛන පිළිබඳව සලකා බැලීමෙන් අනතුරුව එම ගෙවීම් වවුචර්පත් හා ලිපි ලේඛන සම්බන්ධයෙන් මුදල් හා ප්‍රතිපත්ති සැකසීමේ කාරකසභාව විසින් ලබාගත් තීරණ පහත පරිදි වේ.

## තීරණ අංක :- 01

2025 ජූලි, අගෝස්තු මාස තුල සභාව විසින් ලබාගන්නා ලද භාණ්ඩ සහ සේවා වෙනුවෙන් ගෙවීම් කිරීම සඳහා අනුමැතිය ඉල්ලා ඒ් විෂය භාර නිලධාරීන් විසින් ඉදිරිපත් කර ඇති ලිපි හා අදාල වවුචර්පත් පරීක්ෂා කිරීමෙන් අනතුරුව පහත සඳහන් ගෙවීම් සඳහා අනුමැතිය ලබාදීම සුදුසු බවට මුදල් හා ප්‍රතිපත්ති සැකසීමේ කාරක සභාව විසින් තීරණය කරන ලදී.

| ගෙවීම් වර්ගය | විස්තරය | වටිනාකම (රු.) |
|---|---|---|
| ආපදා ණය ගෙවීම් | ආර්.ඩී.ජී.එස්.ජයරත්න මයා | 400000.00 |
| | ආර්.එම්.ආර්.ගීතාංජලී මිය | 400000.00 |
| නඩු සම්බන්ද ගෙවීම් | නඩු අංක 7304/බෙදුම් - නීතිඥ මංගලිකා විජේකොඩි මිය නඩු අංක 7099/බෙදුම් - නීතිඥ මංගලිකා විජේකොඩි මිය | 12000.00<br>6000.00 |
| | නඩු අංක 9256/ඉඩම් - නීතිඥ සපුමල් බණ්ඩාර මයා | 21000.00 |
| සැලසුම් කමිටු දීමනා ගෙවීම් | 2025.06.12 සිට 2025.07.25 දක්වා දීමනාව | 162000.00 |
| සැපයුම් අංශයට අදාල ගෙවීම් | නිසලතැන්න වෙන්දේසි ඉඩමේ ප්‍රධාන මාර්ගය හා අතුරු මාර්ගය මෝටග්‍රේඩර් කිරීම | |
| | රංගම ගෝනාගම මාර්ගයේ සිට ප්‍රේම් මුදලාලිලේ කොන්ක්‍රීට් වැඩපල දක්වා මාර්ගය මෝටර්ග්‍රේටර් කිරීම . | **12,600.00** |
| | මාරගම පොතුගස්වැව මාර්ගය මෝටර්ග්‍රේඩර් කිරීම | **30,000.00** |
| | ගෝනගම සමුපකාරය අසල මාර්ගය මෝටර්ග්‍රේඩර් කිරීම | **17,400.00** |
| | රංගම වැව උඩහා මාර්ගය හැලව දක්වා මෝටර්ග්‍රේඩර් කිරීම | **42,600.00** |
| | ගෝනගම වෙල මැද මාර්ගය මෝටර්ග්‍රේඩර් කිරීම | **57,000.00** |
| | ගලගෙදර වසමේ සිට ගොකටුව දක්වා දිවෙන කෘෂි මාර්ගය හා අතුරු මාර්ග | **149,400.00** |

| | | |
|---|---|---|
| | මෝටර්ග්‍රේඩර් කිරීම | |
| | මින්හෙට්ටිය ඉහලගම පල්ලේවෙල මාර්ගය මෝටර්ග්‍රේඩර් කිරීම | **40,200.00** |
| | මාරගම ඔය මාර්ගය මෝටර්ග්‍රේඩර් කිරීම | **18,600.00** |
| | වැවේවත්ත මාර්ගය මෝටර්ග්‍රේඩර් කිරීම | **33,600.00** |
| | ඔග්ගමුව වත්ත පාර මෝටර්ග්‍රේඩර් කිරීම | **12,000.00** |
| | රංගම වැව පහල සුසන්ත මහතාගේ නිවස දක්වා මාර්ගය මෝටර්ග්‍රේඩර් කිරීම | **12,600.00** |
| | අළකොළදෙනිය කජ්රුක්වත්ත මාර්ගය මෝටර්ග්‍රේඩර් කිරීම | **114,000.00** |
| | එකතුව | **702,600.00** |
| පවිත්‍රතා ගාස්තු | 2025 ජුනි මාසයේ කුරුණෑගල ප්‍රාදේශීය සභා කාර්යාල පරිශ්‍රය පිරිසිදු කිරීමේ සේවාව වෙනුවෙන් ගෙවීම් කිරීම | 432,458.02 |
| දුම්රිය බලපත්‍ර | 2025.07.21 දිනැති ඉන්වොයිස් අංක 2025743105 දරණ 2025 වර්ෂයේ මැයි මසට අදාල දුම්රිය බලපත්‍ර බිල්පත් ගෙවීම් කිරීම . | 27,600.00 |
| බැංකු ගාස්තු | 2025 ජුලි මාසයට අදාලව බැංකු ගාස්තුව බැංකු සැසඳුමෙන් ඉවත් කිරීම සඳහා | 1,457.99 |
| | 2025 වර්ෂය සඳහා කුඩාගල්ගමුව ආදාහනාගාරය සඳහා පරිසර බලපත්‍රය ලබා ගැනීම සඳහා බලපත්‍ර ගාස්තුව හා පරීක්ෂණ ගාස්තුව පළාත් පරිසර අධිකාරිය වෙත ගෙවීම . | 11,250.00 |
| | 2025 වර්ෂය සඳහා දියබාව ආදාහනාගාරය සඳහා පරිසර බලපත්‍රය ලබා ගැනීම සඳහා බලපත්‍ර ගාස්තුව හා පරීක්ෂණ ගාස්තුව පළාත් පරිසර අධිකාරිය වෙත ගෙවීම. | 11,250.00 |
| | පරිසර බලපත්‍ර පරීක්ෂණ ගාස්තුවෙන් 50% ක් ස්ථානීය පරීක්ෂාව සඳහා සහභාගිවන නිලධාරීන් වෙත ගෙවීම . | 151,000.00 |
| වාහන විෂයට අදාල වවුචර් පත් | **PF -7339** කැබ් රථයේ වාර සේවාව සිදු කිරීම (යුනයිටඩ් මෝටර්ස්) | 25832.29 |
| | **RY -8771** ටේලරයේ රක්ෂණාවරණය ලබා ගැනීම(සමූපකාර රක්ෂණ සමාගම) | 14792.59 |
| | **LL -6418** ඩ්‍රම් ට්‍රක් රථයේ රක්ෂණාවරණය ලබා ගැනීම(සමූපකාර රක්ෂණ සමාගම) | 44476.64 |
| | **RG -3898** ගලි රථයේ රක්ෂණාවරණය ලබා ගැනීම(සමූපකාර රක්ෂණ සමාගම) | 17989.72 |
| | **ZA-4979** බැකෝ ලෝඩරයේ රක්ෂණාවරණය ලබා ගැනීම(සමූපකාර රක්ෂණ සමාගම) | 45564.04 |
| | **GD -8981** ට්‍රැක්ටර් රථයේ රේඩියේටරයේ අලුත්වැඩියාව සඳහා ඇස්තමේන්තුව (බීකේ එන්ටර්ප්‍රයිසස්) | 10500.00 |
| | **RX -5566** ටේලරයේ හයිඩ්‍රොලික් බටයේ අලුත්වැඩියාව සඳහා ඇස්තමේන්තුව (බීකේ එන්ටර්ප්‍රයිසස්) | 22700.00 |
| | 36 -8010 ට්‍රැක්ටර් රථයේ **RX -3861** ටේලරයේ වම්පැත්ත රෝදයේ රේසරය අලුත්වැඩියාව සඳහා ඇස්තමේන්තුව (බීකේ එන්ටර්ප්‍රයිසස්) | 13450.00 |
| | **RA -8887** ට්‍රැක්ටර් රථයේ එන්ජිමේ දෝෂ තත්වයන් අලුත්වැඩියාව සඳහා ඇස්තමේන්තුව (බීකේ එන්ටර්ප්‍රයිසස්) | 27000.00 |
| | **PE -0150** කැබ් රථයේ ඉදිරිපස රෝද දෙකෙහි පූර්ණ අලුත්වැඩියාව සඳහා ඇස්තමේන්තුව (ටොයෝටා ලංකා) | 716995.14 |
| | **RD -1623** ට්‍රැක්ටර් රථයේ කින් පින්,සෙන්ටර් පින්,ටයර්රෝඩ් අලුත්වැඩියාව සඳහා ඇස්තමේන්තුව (බීකේ එන්ටර්ප්‍රයිසස්) | 119860.00 |

| | | |
|---|---|---|
| | **PE -0150** කැබ් රථයේ හෝන් පද්ධතිය අලුත්වැඩියාව සඳහා ඇස්තමේන්තුව (පයනියර් ඔටෝ ඉලෙක්ට්‍රිකල්ස්) | 18240.00 |
| | 53-6113 කැබ් රථයේ වාර සේවාව සිදු කිරීම(යන්ත්‍රෝපකරණ අධිකාරිය) | 41388.90 |
| තැන්පතු ආපසු ගෙවීම | වැල්ලව ක්‍රීඩා පිටිය 2025.07.13 වන දින දහම්පාසල් ක්‍රීඩා උත්සවයක් සඳහා වෙන් කර ගැනීමේ ඇප තැම්පත් මුදල | 1000.00 |
| | මාස්පොත සතිපොල මාළු කඩය අංක 04 සඳහා තැම්පත් කළ ඇප මුදල් ආපසු ගෙවීම | 10,483.73 |
| | මාස්පොත සතිපොල මාළු කඩය අංක 01 සඳහා තැම්පත් කළ ඇප මුදල් ආපසු ගෙවීම | 10,483.73 |
| ජල නල එලීම සඳහා මාර්ගය පළුදු කිරිමට අදාල ඇප මුදල් නිදහස් කිරිම 2025 | පී .පී කුසුමාවතී<br>සභා අරමුදලට | 3750.00<br>1250.00 |
| | ඒ .එස් .එම් .සහරාන්<br>සභා අරමුදලට | 4500.00<br>1500.00 |
| | එච් . පී ප්‍රියංගිකා සංජීවනි<br>සභා අරමුදලට | 6000.00<br>6623.81 |
| | ඩී .එම් සේනාරත්න<br>සභා අරමුදලට | 3750.00<br>1250.00 |
| | ඒ.සී එම් බාහිර්<br>සභා අරමුදලට | 4500.00<br>1825.09 |
| | ශක්ති ග්‍රාම සංවර්ධන සමිතිය<br>සභා අරමුදලට | 18,423.35<br>55,270.05 |
| | වදුරාගල වසමේ වදුරාගල පන්සල් මාර්ගයේ පැති බැම්ම ඉදි කිරීමේ අවසන් රුදවුම් ගෙවීම. | 48,473.13 |
| පළාත් නඩත්තු සැලැස්ම 2025 | කටුව තුරුලියගම හරහා නිදහස් ගමට ප්‍රවේශ වන මාර්ගය සංවර්ධනය කිරීමට අදාල අවසන් ගෙවීම | 1,790,353.00 |
| | මාස්පොත භාවනා අසපුවට ප්‍රවේශ වන මාර්ගය සංවර්ධනය කිරීමට අදාල වන අවසන් ගෙවීම | 899,587.42 |
| | ධර්මෝදය මාවත සංවර්ධනය කිරීමට අදාල රුදවුම් ගාස්තු ගෙවීම 2024. | 99,906.22 |
| | තිරගම ගම මැද පාරේ වීරසේකර මහතාගේ නිවස ඉදිරිපිට මාර්ගය සංවර්ධනය කිරීමට අදාල රුදවුම් ගෙවීම 2024 | 99,412.78 |
| | 2025 වර්ශයේ කටුපිටිය දකුණ ග්‍රාම නිළධාරි වසමට අයත් ඇලිවැලතැන්න මාර්ගය සංවර්ධනය කිරීමට අදාලඅවසන් ගෙවීම | 898,416.34 |
| | 2025වර්ෂයේ ඉදුල්ගොඩකන්ද රෝහල අසල පාර සංවර්ධනය කිරීමට අදාල අවසන් ගෙවීම | 1339924.94 |
| | 2025 වර්ෂයේ උයන්දන ගැමුණු මාවත 2 පියවර සංවර්ධනය කිරිමට අදාල අවසන් ගෙවීම | 99,949.48 |
| | 2024 වර්ෂයේ උයන්දන 04 වන පටුමග සංවර්ධනය කිරිමට අදාල රුදවුම්ගෙවීම | 99,908.21 |
| | 2024 වර්ෂයේ මහගම ගනාරඹ මාර්ගය සංවර්ධනය කිරිමට අදාල රුදවුම්ගෙවීම | 99,929.21 |
| | 2024 වර්ෂයේ කොන්පොල දෙණිය උඩුමුල්ල මාර්ගය සංවර්ධනය කිරිමට අදාල රුදවුම්ගෙවීම | 99,919.65 |
| | 2024 වර්ෂයේ ස්ප්‍රින් ෆීල්ඩ් සුභ සාධක සමිතියේ සමිති ශාලාව ඉදිකිරීමට අදාල රුදවුම්ගෙවීම | 100,000.00 |
| කඳුකර දශකය 2024 -2033 | මානෙල්ගම පොදු ක්‍රීඩාංගනය අසල සිට කනත්ත දක්වා මාර්ගය බෝක්කු දමා සංවර්ධනය කිරීමට අදාල රුදවුම් ගෙවීම | **96,678.50** |
| | බෝගමුව ගම මැද පාරේ අබලන්ව පවතින ස්ථාන සංවර්ධනය කිරීමට අදාල රුදවුම් ගෙවීම | **96,975.00** |
| | කොස්ගහ කුඹුර මාර්ගය සංවර්ධනය කිරීමට අදාල රුදවුම් ගෙවීම | **145,153.68** |

| | | |
|---|---|---|
| | ප්‍රභීත් වෛද මහතාගේ නිවස දක්වා ඇති මාර්ගයේ නවතා ඇති තැන සිට ඉදිරියට සංවර්ධනය කිරීමට අදාල රුදවුම් ගෙවීම | **96,462.67** |
| | මලගනේ වෙල මැද මාර්ගයේ පැතිබැම්ම ඉදිකර මාර්ගය සංවර්ධනය කිරීමට අදාල රුදවුම් ගෙවීම | **145,475.00** |
| | මැද පිල්ලෑව මාර්ගයේ ඉතිරි කොටස සංවර්ධනය කිරීමට අදාල රුදවුම් ගෙවීම | **48,475.00** |
| | උඩහේවාපොල ගම මාර්ගයේ අබලන්ව ඇති මාර්ගයේ පැතිබැම්ම ඉදිකිරීමට අදාල රුදවුම් ගෙවීම | **96,975.00** |
| | බෝධිගම ගම වටා මාර්ගයේ අත්‍යාවශ්‍ය ස්ථාන සංවර්ධනය කිරීමට අදාල රුදවුම් ගෙවීම. | **145,475.00** |
| | ගල්ලිඳ මාර්ගයේ අබලන් වූ ස්ථාන පිළිසකර කර සංවර්ධනය කිරීමට අදාල රුදවුම් ගෙවීම | **96,975.00** |
| | හදුරුක්කන්ද වැලි වංගුව පහළ කොටස සංවර්ධනය කිරීමට අදාල රුදවුම් ගෙවීම | **145,233.**37 |
| | ඉහළගම මාර්ගයේ සිට දුම්බුළුවාව කොටස සංවර්ධනය කිරීමට අදාල රුදවුම් ගෙවීම | **47,539.78** |
| කදුකර දශකය 2024 -2033 | සණස මාර්ගය සංවර්ධනය කිරීමට අදාල රුදවුම් ගෙවීම | **87,275.00** |
| | දෙහිගහමුලතැන්න සිට මොරගොල්ල දක්වා මාර්ගය සංවර්ධනය කිරීමට අදාල රුදවුම් ගෙවීම | **48,124.68** |
| | බොරළුවත්ත නිර්මල සුභ සාධක සමිතිශාලා ගොඩනැගිල්ලේ ඉතිරි වැඩ නිම කිරීමට අදාල රුදවුම් ගෙවීම | **29,021.10** |
| | තෝරයාය දම්මඩවත්ත බොරළුවත්ත මාර්ගය කැටගල් ඇල්ලීමට අදාල රුදවුම් ගෙවීම | **48,475.00** |
| | ආඳාගල කන්දවත්ත සුභ සාධක සමිති ගොඩනැගිල්ලේ ඉතිරි වැඩ සඳහා නිම කිරීමට අදාල රුදවුම් ගෙවීම | **37,629.00** |
| | තෝරයාය සායන මධ්‍යස්ථාන මාර්ගයේ ඉතිරි කොටස සංවර්ධනය කිරීමට අදාල රුදවුම් ගෙවීම | **67,875.00** |
| | නාරම්පොල පළමු අතුරු මාර්ගය සංවර්ධනය කිරීමට අදාල රුදවුම් ගෙවීම | **48,475.00** |
| | අවමංගල්‍යාධාර හා සුභ සාධක සමිති ශාලාවේ ඉතිරි වැඩ නිම කිරීමට අදාල රුදවුම් ගෙවීම | **47,475.00** |

තීරණ අංක :- 02

ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරියේ සාරගම දිස්ත්‍රික් කාර්යාලයේ කසල වලක් සකස් කර ගැනීම සඳහා බැකෝ යන්ත්‍රයක සේවය ලබාදෙන ලෙස ඉල්ලා එවා ඇති ලිපිය පිළිබඳව සලකා බැලීමෙන් අනතුරුව එම කාර්යය සිදු කරදීම සඳහා අනුමැතිය ලබා ගැනීමට ගරු ආණ්ඩුකාරතුමාට යොමු කිරීම සුදුසු බව මුදල් හා ප්‍රතිපත්ති සැකසීමේ කාරක සභාව විසින් තීරණය කරන ලදී.

තීරණ අංක :- 03

සභාවට අයත් PF-7339 කැබ්රථය අනතුරකට පත් කිරීම වෙනුවෙන් කුරුණෑගල ම/උ බී.1994/22 දරණ නඩුවට අදාලව වාර්තාවක් ඉල්ලා කුරුණෑගල පොලිස් රථවාහන අංශය මගින් යොමු කර ඇති ලිපිය පිළිබඳව සලකා බැලීමෙන් අනතුරුව එම කැබ් රථය පැදවූ රියදුරුට එරෙහිව සිදුකරන ලද විධිමත් විනය පරීක්ෂණයෙන් පසුව කැබ් රථයට සිදුවූ හානිය තක්සේරු කර මාසික වාරික වශයෙන් ඔහුගෙන් අයකරමින් පවතින බව දන්වා යැවීම සුදුසු බවට මුදල් හා ප්‍රතිපත්ති සැකසීමේ කාරක සභාව විසින් තීරණය කරන ලදි.

තීරණ අංක : – 04

ප්‍රධාන කාර්යාලයේ ආපන ශාලා ගොඩනැගිල්ල අවපැහැ ගැන්වී ඇති බැවින් නව බදුකරුවෙකු වෙත එම ගොඩනැගිල්ල බාරදීමට ප්‍රථමව තීන්ත ආලේප කිරීම සඳහා අනුමැතිය ඉල්ලා ආදායම් ප්‍රවර්ධන නිලධාරී විසින් ඉදිරිපත් කර ඇති ලිපිය පිළිබඳව සලකා බැලීමෙන් අනතුරුව නව බදුකරුවෙකු එම දේපල බදු ලබා ගත් පසුව ඔහුගේ අභිමතය පරිදි තීන්ත ආලේප කර ගැනීමට අවසර ලබාදීම සුදුසු බවට මුදල් හා ප්‍රතිපත්ති සැකසීමේ කාරක සභාව විසින් තීරණය කරන ලදි.

තීරණ අංක : – 05

පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනය විසින් මහජන නියෝජිතයන්ට සහ නිලධාරීන් වෙත එවා ඇති පළාත් පාලන නීතිය පිළිබඳ සහතිකපත්‍ර පාඨමාලාව සඳහා සුදුසු මහජන නියෝජිතයෙක් යොමු කරන ලෙස ඉල්ලා විෂයභාර නිලධාරී විසින් ඉදිරිපත් කර ඇති ලිපිය පිළිබඳව සලකා බැලීමෙන් අනතුරුව ඒ සඳහා සභා අරමුදලින් පාඨමාලා ගාස්තු වශයෙන් රු.35000.00 ක් ගෙවා ගරු මන්ත්‍රී බී.එම්.එස්.එම්.මිත්‍රානන්ද මහතා යොමු කිරීම සුදුසු බවට මුදල් හා ප්‍රතිපත්ති සැකසීමේ කාරක සභාව විසින් තීරණය කරන ලදි.

තීරණ අංක : – 06

පුත්තලම් පාර වම- වරිපනම් අංක 201/10 දේපල සඳහා තක්සේරු දෙපාර්තමේන්තුව විසින් එවා ඇති රු.558514.00 ක තක්සේරු වටිනාකම, විරෝධතා පරීක්ෂණයකින් පසුව රු.55857.00ක් ලෙස සංශෝධනය විය යුතු බවට තක්සේරු දෙපාර්තමේන්තුව විසින් දන්වා එවා ඇති ලිපිය කමිටුගත කරන ලදුව එම සංශෝධිත තක්සේරු වටිනාකම පිළිගැනීමටත් ඒ අනුව නව තක්සේරුව ක්‍රියාත්මක කල 2022 වර්ෂයේ සිට සභාවේ ලේඛණ සහ වරිපනම් මෘදුකාංගය සංශෝධනය කර නිවැරදි කරගැනීමටත් සුදුසු බව මුදල් හා ප්‍රතිපත්ති සැකසීමේ කාරක සභාව විසින් තීරණය කරන ලදි.

තීරණ අංක : – 07

මේ දක්වා හිග වරිපනම් බදු අයකර ගැනිම සඳහා 2025 සැප්තැම්බර් මාසයේ සිට ඔක්තෝබර් මාසය දක්වා දින 20 ක් තුල ක්ෂේත්‍රගත විමට නිලධාරීන් 13 කුගෙන් සමන්විත කණ්ඩායමක් යෙදවීම සඳහාත් එසේ සහභාගි වන පිරිසට දින 20 කට තේපැන් සහ දිවා ආහාරය ලබා දීම සඳහා ආදායම් ප්‍රවර්ධන නිලධාරී විසින් ඉදිරිපත් කර ඇති රු.156000.00 ක වියදම් ඇස්තමේන්තුවට සහ වැඩසටහන අවසන් වූ

විගස බිල්පත් මගින් පියවීමට යටත්ව ඇය විසින් එම මුදල අත්තිකාරමක් ලෙස ලබා දෙන ලෙස ඉල්ලා ඉදිරිපත් කර ඇති ලිපියට අනුමැතිය ඉල්ලා ඉදිරිපත් කර ඇති ලිපිය පිළිබඳව සාකච්ඡා කිරීමෙන් අනතුරුව එම වියදම් ඇස්තමේන්තුව අනුමත කිරීමටත් අත්තිකාරම ලබා දීමත් සුදුසු බවට මුදල් හා ප්‍රතිපත්ති සැකසීමේ කාරක සභාව විසින් තීරණය කරන ලදි.

තීරණ අංක :- 08

මාස්පොත වැලගනේ පිහිටි ග්‍රීන් විලේජ් සුභසාධක සමිතිය විසින් ග්‍රීන් විලේජ් නිවාස ව්‍යාපෘතියේ අක්කරයක් පමණ වන පොදු ඉඩම ක්‍රීඩා පිටියක් ලෙස සංවර්ධනය කර දෙන ලෙස ඉල්ලා ඉදිරිපත් කර ඇති ලිපිය පිළිබඳව සලකා බැලීමෙන් අනතුරුව උක්ත ඉඩම සභාව සතු එකක් නම් තාක්ෂණ නිලධාරී වාර්තාවට අනුව JCB යන්ත්‍රය යොදවා එම ක්‍රීඩා පිටිය සංවර්ධනය කිරීමත්,එසේ නොවේ නම් ගරු ආණ්ඩුකාර අනුමැතියට යොමු කිරීමත් සුදුසු බවටත් මුදල් හා ප්‍රතිපත්ති සැකසීමේ කාරක සභාව විසින් තීරණය කරන ලදි.

තීරණ අංක :- 09

මෝටර් ග්‍රේඩර් කර ඇති පහත මාර්ග සඳහා බොරළු ලබාදෙන ලෙස ඉල්ලා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී බී.එම්.එස්.එම්. මිත්‍රානන්ද මහතා විසින් ඉදිරිපත් කර ඇති ලිපිය පිළිබඳව සලකා බැලීමෙන් අනතුරුව එම ඉල්ලීම අනුමත කිරීම සුදුසු බවට මුදල් හා ප්‍රතිපත්ති සැකසීමේ කාරක සභාව විසින් තීරණය කරන ලදි.

| වසම | මාර්ගය |
|---|---|
| 01. මඩිතියවල | මඩිතියවල වසමේ පොදු ළිඳ දක්වා ඇති මාර්ගය |
| | නන්දන මහතාගේ නිවස දක්වා ඇති මාර්ගය |
| | බංගලාවත්ත දෙවන පියවර |
| | සමනල උයන මාර්ගය |
| 02. රත්ගල්ල | රත්ගල්ල විශ්වෝදා පාසැල ඉදිරිපිට හෙට්ටිවත්ත නාමල් උයන මාර්ගය |
| | මංචි ආයතනය අසල මාර්ගය |
| 03. බෝයගනේ | මැඩිල්ල හා ගල්කඩුල්ල මාර්ගය |

තීරණ අංක :- 10

කර්පන විනයගර් එස්ටේට් නැමති ඉඩමේ සිට තෝරවතුර රඹුක්කන ප්‍රධාන මාර්ගය දක්වා මීටර් 50 ක දුරක් කියුබ් දෙකේ බර පන්තියට අයත් ටිපර් රථ භාවිතා කර බොරළු ප්‍රවාහනය සඳහා අවසර ලබාදෙන

ලෙස ඉල්ලා සීඅයිසී ඉදිරිපිට, උයන්දන, කුරුණෑගල ලිපිනයේ පදිංචි ජී.ජී.ආර්.ටී.ගමගේ මහතා විසින් ඉදිරිපත් කර ඇති ලිපිය පිළිබඳව සලකා බැලීමෙන් අනතුරුව සංශෝධිත ගාස්තු අයකර බොරළු ප්‍රවාහනය කිරීම සඳහා ගිවිසුම්ගත වීම සුදුසු බවට මුදල් හා ප්‍රතිපත්ති සැකසීමේ කාරක සභාව විසින් තීරණය කරන ලදි.

තීරණ අංක :- 11

රුක්ගොල්ල,හේනේගෙදර නැමති ඉඩමේ සිට සියඹලන්ගමුව පාසැල දක්වා මීටර් 900 ක දුරක් බොරළු ප්‍රවාහනය සඳහා අවසර ලබාදෙන ලෙස ඉල්ලා නො.277,ඉහලගම පැල්ලන්දෙනිය මාස්පොත ලිපිනයේ පදිංචි ආර්.එම්.එම්.පියසේන මිය විසින් ඉදිරිපත් කර ඇති ලිපිය පිළිබඳව සලකා බැලීමෙන් අනතුරුව සංශෝධිත ගාස්තු අයකර එම මාර්ගයේ බොරළු ප්‍රවාහනය කිරීම සඳහා ගිවිසුම් කාලය දීර්ඝ කිරීම සුදුසු බවට මුදල් හා ප්‍රතිපත්ති සැකසීමේ කාරක සභාව විසින් තීරණය කරන ලදි.

තීරණ අංක :- 12

පාලුගම,කුරියම්පොල පදිංචි ටී.ජී.දේවිකා සරෝජිනී යන අයගේ ස්වාමිපුරුෂයා පූර්ණ අංශභාග රෝගී තත්වයට පත් වී සිටින බැවින් ඔහුගේ වෛද්‍ය ප්‍රතිකාර සඳහා රෝගී ආධාර මුදලක් ලබා දෙන ලෙස ඉල්ලා ඉදිරිපත් කර ඇති ලිපියට අනුව, අඩු ආදායම්ලාභී පවුලක් බවට ප්‍රදේශයේ ග්‍රාම නිලධාරී විසින් තහවුරු කර ඇති නිසා සහ ඔහුගේ වෛද්‍ය වාර්තා ඉදිරිපත් කර ඇති නිසා එම අය වෙත රු.25000.00 ක රෝගී ආධාර මුදලක් ලබාදීම සඳහා ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතියට යොමු කිරීම සුදුසු බවට මුදල් හා ප්‍රතිපත්ති සැකසීමේ කාරක සභාව විසින් තීරණය කරන ලදි.

තීරණ අංක :- 13

වළකුඹුර,කුදුම්බුව, කොහිගේගෙදර පදිංචි ඩබ්.උදය සුමනසිරි විජේබණ්ඩාර යන අයගේ බිරිඳ අංශභාග රෝගී තත්වයට පත් වී සිටින බැවින් ඇයගේ වෛද්‍ය ප්‍රතිකාර සඳහා රෝගී ආධාර මුදලක් ලබා දෙන ලෙස ඉල්ලා ඉදිරිපත් කර ඇති ලිපියට අනුව, අඩු ආදායම්ලාභී පවුලක් බවට ප්‍රදේශයේ ග්‍රාම නිලධාරී විසින් තහවුරු කර ඇති නිසා සහ ඇයගේ වෛද්‍ය වාර්තා ඉදිරිපත් කර ඇති නිසා එම අය වෙත රු.25000.00 ක රෝගී ආධාර මුදලක් ලබාදීම සඳහා ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතියට යොමු කිරීම සුදුසු බවට මුදල් හා ප්‍රතිපත්ති සැකසීමේ කාරක සභාව විසින් තීරණය කරන ලදි.

තීරණ අංක :− 14

මීටර් 150 ක් පමණ වන කුඩලුමුල්ල මාර්ගයේ වැඩ අවසන් වී ඇති බැවින් ඊට අවශ්‍ය බොරළු සහ අඩි1½ x 20 හියුම්පයිප්ප ලබාදෙන ලෙස ඉල්ලා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඩබ්.වයි.දූලිප් සිල්වා මහතා විසින් ඉදිරිපත් කර ඇති ලිපිය පිළිබඳව සලකා බැලීමෙන් අනතුරුව එම මාර්ගයට අවශ්‍ය බොරළු සහ හියුම් පයිප්ප ලබාදීම සුදුසු බවට මුදල් හා ප්‍රතිපත්ති සැකසීමේ කාරක සභාව විසින් තීරණය කරන ලදි

තීරණ අංක :− 15

කුරුණෑගල ප්‍රාදේශීය සභා බලප්‍රදේශයේ ඉඩම් විකුණන අවස්ථාවලදී අයකරනු ලබන මුද්දර ගාස්තු අදාල ඉඩම් අයිති, ඉඩම් හිමිකම් නිරවුල් කිරීමේ කාර්යාල මගින් සභාව වෙත එවන අතර, එම ආයතන වෙත එක් ඔප්පු ලේඛණයක් සකස් කිරීම වෙනුවෙන් රු.100 ක් කාර්යමංඩල දීමනා වශයෙන් ගෙවීම් කිරීමට අනුමැතිය ඉල්ලා විෂයභාර නිලධාරී විසින් ඉදිරිපත් කරන ලද ලිපිය පිළිබඳව සලකා බැලීමෙන් අනතුරුව ඒ සඳහා අනුමැතිය ලබාදීම සුදුසු බවට මුදල් හා ප්‍රතිපත්ති සැකසීමේ කාරක සභාව විසින් තීරණය කරන ලදි.

තීරණ අංක :− 16

මාස්පොත පොල භූමියේ පවත්නා කඩ පේලියේ ආදායම් උත්පාදනය අසීරු වී ඇති හෙයින් මාසික කඩකුලිය අඩුකර දෙන ලෙස ඉල්ලා එම කඩපේලියේ බදු කරුවන් කිහිපදෙනෙක් විසින් ඉදිරිපත් කර ඇති ලිපිය පිළිබඳව සලකා බැලීමෙන් අනතුරුව එම කඩපේලියේ තක්සේරු වටිනාකම සංශෝධනය කිරීම සඳහා තක්සේරු දෙපාර්තමේන්තුව වෙත යොමු කිරීම සුදුසු බවට මුදල් හා ප්‍රතිපත්ති සැකසීමේ කාරක සභාව විසින් තීරණය කරන ලදි.

තීරණ අංක :− 17

පහත නම් සඳහන් මාර්ග වල කානු පද්ධති සකස් කර ගැනීම සඳහා JCB යන්ත්‍රය ලබාදෙන ලෙස ඉල්ලා ගරු උපසභාපති ජී.ඒ.සී.පී.රත්නවර්ධන මිය විසින් කර ඇති ඉල්ලීමට අනුව පහත සඳහන් එම මාර්ග සංවර්ධනය කිරීම සඳහා JCB යන්ත්‍රය ලබාදීම සුදුසු බවට මුදල් හා ප්‍රතිපත්ති සැකසීමේ කාරක සභාව විසින් තීරණය කරන ලදි.

01. සුදර්ශණ මාවත.

02. පළමු පියවර අතුරු මාර්ග
03. ගැමුණු මාවත(පෙදෙස) පළමු පටුමග සිට ඉදිරියට
04. බමුණාවල පන්සල අසල අඹසෙවන කඩය ලග මාර්ගය
05. සුදර්ශණ මාවත දෙවන පටුමග
06. පිංවලපිටිය වත්ත පිට්ටනිය

තීරණ අංක :- 18

බෝයගනේ මහ විද්‍යාලයේ ක්‍රීඩා පිට්ටනිය වල්බිහිවී පාසැල් සිසුන්ට ක්‍රීඩා කටයුතු කරගෙන යාමේ අපහසුතාවයක් ඇති වී ඇති හෙයින් ගාස්තු අයකිරීමකින් තොරව එහි තණකොළ කපා සකස් කරදෙන ඉල්ලා එම විද්‍යාලයේ විදුහල්පතිතුමා විසින් ඉදිරිපත් කර ඇති ලිපිය පිළිබඳව සලකා බැලීමෙන් අනතුරුව සභාව මගින් බෝයගනේ මහ විද්‍යාලයේ ක්‍රීඩා පිට්ටනියේ ගාස්තු අයකිරීමකින් තොරව තණකොල කපා දීම සඳහා ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතියට යොමු කිරීම සුදුසු බවට මුදල් හා ප්‍රතිපත්ති සැකසීමේ කාරක සභාව විසින් තීරණය කරන ලදි.

තීරණ අංක :- 19

අස්වැද්දුම රයාන් සුපර් සෙන්ටර් ආයතනයට යාබඳව ඉදිවෙමින් පවතින ගොඩනැගිල්ලේ එළහරක් මස්කඩයක් පවත්වාගෙන යාම සඳහා අනුමැතිය ඉල්ලා සීතා ඇලවත්ත පාරේ පදිංචි කේ.ඕ.කේ.එම්.පිලාඞ් යන අය විසින් ඉදිරිපත් කර ඇති ලිපිය පිළිබඳව සලකා බැලීමෙන් අනතුරුව ඝෝගාතකාගාර ආඥාපනතේ විධිවිධාන ප්‍රකාරව විරෝධතා කැඳවීම සුදුසු බවට මුදල් හා ප්‍රතිපත්ති සැකසීමේ කාරක සභාව විසින් තීරණය කරන ලදි.

තීරණ අංක :- 20

සභාවට අයත් මහජන පුස්තකාල වලට 2025 වර්ෂයට අදාල පොත් මිලදී ගැනීම සඳහා අනුමැතිය ඉල්ලා සභාවේ ප්‍රජා සංවර්ධන නිලධාරී විසින් ඉදිරිපත් කර ඇති ලිපිය පිළිබඳව සලකා බැලීමෙන් අනතුරුව පහත පරිදි පුස්තකාල සඳහා ප්‍රතිපාදන වෙන් කර පොත් මිලදී ගැනීම සුදුසු බවට මුදල් හා ප්‍රතිපත්ති සැකසීමේ කාරක සභාව විසින් තීරණය කරන ලදි.

| | |
|---|---|
| වැල්ලව මහජන පුස්තකාලය | රු.200000.00 |
| බෝයගනේ මහජන පුස්තකාලය | රු.100000.00 |
| කුඩාගල්ගමුව මහජන පුස්තකාලය | රු.200000.00 |

සාරගම මහජන පුස්තකාලය රු.200000.00

දොරටියාව මහජන පුස්තකාලය රු.100000.00

ගොන්න මහජන පුස්තකාලය රු.100000.00

තීරණ අංක :- 21

මීගමු පාර,නව මල්කඩුවාව,ලේක් හවුස් එස්ටේට් මාර්ගයේ පිහිටි විදුර විදුහලට පිවිසෙන ප්‍රධාන මාර්ගයේ සිට පාසැල තෙක් ඇති මී.50 ක් පමණ වන මාර්ගය ඉතා අබලන් වී ඇති බැවින් එම මාර්ගය බොරළු දමා හැකි ඉක්මණින් පිළිසකර කර දෙන ලෙස ඉල්ලා විදුර විදුහලේ විදුහල්පතිතුමා විසින් ඉදිරිපත් කර ඇති ලිපිය පිළිබඳව සලකා බැලීමෙන් අනතුරුව එම මාර්ගය බොරළු දමා පිළිසකර කරදීම සුදුසු බවට මුදල් හා ප්‍රතිපත්ති සැකසීමේ කාරක සභාව විසින් තීරණය කරන ලදි.

තීරණ අංක :- 22

සභා අරමුදලින් ආධාර මුදල් ලබාදීමේදී එකී වියදම් දැරීමේ සීමාවන් සම්බන්ධව වන දෙපාර්තමේන්තු චක්‍රලේඛ 2015/01 හි මුදල් සීමාවන් සංශෝධනය කිරීම සඳහා පත් කල කමිටුව විසින් ලබාදී ඇති වාර්තාව පිළිබඳව සලකා බැලීමෙන් අනතුරුව පහත සඳහන් වන සංශෝධිත මුදල් සීමාවන් පළාත් පාලන කොමසාරිස් අනුමැතියට යොමු කිරීම සුදුසු බවට මුදල් හා ප්‍රතිපත්ති සැකසීමේ කාරක සභාව විසින් තීරණය කරන ලදි.

| අනු අංකය | වැය කාණ්ඩය | අනුමත මුදල | යෝජිත මුදල |
|---|---|---|---|
| 01 | ආගමික ස්ථාන | 20000.00 | 50000.00 |
| 02 | ක්‍රීඩා තරග හා උපාංග | 15000.00 | 30000.00 |
| 03 | සමිති සමාගම | 15000.00 | 30000.00 |
| 04 | රාජ්‍ය ආයතන හා වෙනත් ආයතන | 10000.00 | 20000.00 |
| 05 | • තරඟ සඳහා ඉදිරිපත් වීමට මූල්‍යමය හා ද්‍රව්‍යමය ආධාර ලබාදීම<br>• නිවාස ආධාර<br>• පුහුණු වැඩසටහන් සඳහා මූල්‍යමය ආධාර<br>• ලෙඩරෝග<br>• වෙනත් ආධාර | 25000.00<br>25000.00<br>25000.00<br>25000.00<br>25000.00 | 30000.00<br>50000.00<br>30000.00<br>30000.00<br>25000.00 |

තීරණ අංක :- 23

2025.08.04 දින සිට කුරුණෑගල ප්‍රාදේශීය සභාවේ ආදායම් පරීක්ෂක ලෙස සේවය කරන ජේ.ඒ.සිසිර කුමාර මහතාට හිමි නිළ ඇඳුම් සහ පාවහන් දීමනාව සඳහා ගෙවීම් කිරීමට අනුමැතිය ඉල්ලා සැපයුම් නිලධාරී ඉදිරිපත් කර ඇති ලිපිය පිළිබඳව සලකා බැලීමෙන් අනතුරුව ඒ සඳහා පහත පරිදි ගෙවීම් කිරීම සුදුසු බවට මුදල් හා ප්‍රතිපත්ති සැකසීමේ කාරක සභාව විසින් තීරණය කරන ලදි.

| | |
|---|---|
| නිළ ඇඳුම් දිමනාව (කෘතිම කාකි රෙදි මීටර් 9 ක් සඳහා) | -රු.11700.00 |
| මැහුම් කුලිය | -රු. 750.00 |
| පාවහන් දීමනාව | -රු.7999.00 |
| මේස් සඳහා (කුට්යම් 01) | -රු. 430.00 |
| එකතුව | රු.20879.00 |

තීරණ අංක :- 24

2025.08.14 දිනැති මහසභාවේ අනුමත කරන ලද 2025.09.15 දින සිට 2025.09.21 දින දක්වා පැවැත්වීමට සැලසුම් කර ඇති පළාත් පාලන සතිය වැඩසටහන සංශෝධනය කර ප්‍රජා සංවර්ධන නිලධාරී විසින් කමිටුව වෙත ඉදිරිපත් කරන ලදුව උක්ත වැඩසටහන පහත පරිදි සංශෝධනය කර ක්‍රියාත්මක කිරීම සුදුසු බවට මුදල් හා ප්‍රතිපත්ති සැකසීමේ කාරක සභාව විසින් තීරණය කරන ලදි

## පළාත් පාලන සතිය 2025

## (2025 සැප්තැම්බර් 15 වන දින සිට 2025 සැප්තැම්බර් 21 වන දින දක්වා )

| අනු අංකය | දිනය | | ක්‍රියාත්මක කරනු ලබන වැඩසටහන් විස්තරය | පවත්වනු ලබන ස්ථානය | අපේක්ෂිත වියදම |
|---|---|---|---|---|---|
| 01 | 2025.09.15 | ජංගම සේවා දිනය | 1.රාජ්‍යය ආයතන සම්බන්ධ කරගනිමින් මහජන සේවා සැපයීම.<br>• වීථි පහන් අලුත්වැඩියාව<br>• පරිසර ගැටලු පරීක්ෂාව<br>• ඉඩම් පිළිබඳ ගැටලු පරීක්ෂාව<br>• අනවසර ඉදිකිරීම් පිළිබඳ ගැටලු<br>• විවිධ සංවර්ධන යෝජනා ලබා ගැනීම් | තල්විට කොට්ඨාශය<br><br>තල්විට විහාරස්ථානය | රු.20,000.00 |

| | | | | | |
|---|---|---|---|---|---|
| | | | • ජල හා සනීපාරක්ෂක ගැටලු<br>2.සෞඛ්‍ය සායනය (බටහිර, ආයුර්වේද, අක්ෂි සායන)<br>3.සෞඛ්‍ය උපදේශන වැඩසටහන<br>4.මාර්ග ප්‍රතිසංස්කරණ කටයුතු (මෝටර්ග්‍රේඩර් කිරීම) | | රු. 200,000.00 |
| 02 | 2025.09.16 | පරිසර හා රුක් රෝපණ දිනය | 01.පරිසරය සුරැකීම සම්බන්ධ පාසල් දරුවන් හා දෙමාපියන් දැනුවත් කිරීමේ වැඩසටහන්/රුක් රෝපණ වැඩසටහන (දොරටියාව සහ බෝගමුව විද්‍යාලය) | දොරටියාව කොට්ඨාශය දොරටියාව විද්‍යාලය/ බෝගමුව විද්‍යාලය | රු.35,000.00 |
| | | | 02.නොදිරන කසළ එකතු කිරීමේ වැඩසටහන පැවැත්වීම | දොරටියාව කොට්ඨාශය | |
| | | | 03.මාර්ග දෙපස අව්ධිමත් කසල එකතු කිරීමේ වැඩසටහන | දොරටියාව මාර්ගය | |
| | | | 04.ආහාර සුරක්ෂිතතාවය සඳහා පොදු ඉඩම්වල පළතුරු පැළ රෝපණය කිරීමේ වැඩසටහන | කෝම්පල පොදු ඉඩම | |
| | | | 05.ජල පෝෂක ප්‍රදේශ තුළ රුක්රෝපණය කිරීම (වෙන්නොරුව වැව) | දොරටියාව තාවුල්ල | |
| | | | 06.3R සංකල්පය සම්බන්ධව (**Reduse, Reuse, Recycle**) වැඩිහිටි ප්‍රජාව දැනුවත් කිරීම | මානෙල්ඔළුව පන්සල | |
| | | | 07.ගෘහස්ත කොම්පෝස්ට් නිෂ්පාදනය ප්‍රවර්ධනය කර ව්‍යවසායකයින් නිර්මාණය කිරීම හා කොම්පෝස්ට් බඳුන් ලබාදීම | ඉඳුල්ගොඩ පන්සල | |
| 03 | 2025.09.17 | සෞඛ්‍ය හා සනීපාරක්ෂක දිනය | 1.ගර්භනී මව්වරුන් සඳහා සෞඛ්‍ය වැඩසටහන<br>• ප්‍රජා අනුග්‍රහකත්වයෙන් කොළ කැඳ හා පෝෂණ මලු ලබා දීම | තෝරයාය කොට්ඨාශය | |
| | | | 2. පෙර පාසල් දරුවන් සඳහා යහපත් සෞඛ්‍ය පුරුදු දැනුවත් කිරීමේ වැඩසටහන<br>*ප්‍රජා දායකත්වයෙන් දරුවන් සඳහා කොළ කැඳ ලබා දීම<br>සනීපාරක්ෂක ද්‍රව්‍ය ලබා දීම (නාරම්පොල,හැඟව,රනවන,තෝරයාය පෙරපාසැල්) | ඇවලෝන් වත්ත ප්‍රජා ශාලාව<br>නාරම්පොල,හැඟව,රනවන,තෝරයාය පෙරපාසැල් | රු.20,000.00 |
| | | | 3.ප්‍රජාව සඳහා යහපත් සෞඛ්‍ය පුරුදු පිළිබඳ දැනුවත් කිරීම | | |
| | | | 4. සෞඛ්‍ය සායන (ආයුර්වේද සායන)<br>• ඖෂධීය කොළ කැඳ ලබා දීම | | |
| | | | 5.එක් දින වොලිබෝල් පුහුණු කඳවුරක් පැවැත්වීම | | |
| | | | 6.දම්බඩවත්ත පොදු ඉඩම ක්‍රීඩා පිටියක් ලෙස මෝටර් ග්‍රේඩර් කිරීම | ඇවලෝන් වත්ත ක්‍රීඩා පිටිය | රු.100,000.00 |
| | | | 7. මාර්ග අනතුරු වලක්වාලීම සඳහා රියදුරු මහතුන් වෙනුවෙන් උපදේශන වැඩසටහන් | | |
| 04. | 2025.09.18 | ආදායම් ප්‍රවර්ධන | 1.වරිපනම්/ව්‍යාපාර බදු ගෙවන්නන් සඳහා **whatapp group** නිර්මාණය කිරීම | යන්තම්පලාව කොට්ඨාශය | |

| | | | | | |
|---|---|---|---|---|---|
| | | දිනය | 2025.09.15 ප්‍රචාරනය<br>2025.09.16 දැනුවත් කිරීම<br>2025.09.17 අයකිරීම | | රු.10,000.00 |
| | | | 2.ආදායම් ප්‍රවර්ධන කටයුතු සිදුකිරීම (ප්‍රචාරණ, ඒකක මට්ටමින් වරිපනම් බදු මුදල් එකතු කිරීම) | | |
| 05. | 2025.09.19 | සාහිත්‍ය අධ්‍යාපන හා පුස්තකාල ප්‍රවර්ධන දිනය | 01.පුස්තකාල තරඟ පැවැත්වීම | කුඩාගල්ගමුව කොට්ඨාශය කුඩාගල්ගමුව පුස්තකාලය | රු.25,000.00 |
| | | | 02.පෙරපාසල් දරුවන් කියවීම ප්‍රගුණ කිරීම සඳහා පුස්තකාලය තුළ කතන්දර පැය වැඩසටහන පැවැත්වීම | | |
| | | | 03.පොත් ප්‍රදර්ශන පැවැත්වීම | | |
| | | | 04.අනුග්‍රාහකත්වය ලබාගනිමින් නොමිලේ පුස්තකාල සාමාජිකත්වය ලබාදීම | | |
| | | | 05.පාඨක සමාජය හරහා පුස්තකාලය තුළ ශ්‍රමදාන පැවැත්වීම | | |
| 06 | 2025.09.20 | මහජන උපයෝගීතා සහ ක්‍රීඩා දිනය | 01.වීථි පහන් නඩත්තුව (අකරගන දකුණ, දඹකන්ද වත්ත, රත්ගල්ල) | බෝයගනේ කොට්ඨාශය | |
| | | | 02.ක්‍රීඩාපිටි සංවර්ධනය (දඹකන්ද වත්ත, රත්ගල්ල) | | රු 50,000.00 |
| | | | 03.සුසානභූමි සංවර්ධනය (රත්ගල්ල, වෙරළුගොල්ල) | | රු 100,000.00 |
| | | | 04.මාර්ග අලංකරණය සඳහා කරඳ පැළ සිටුවීම ( හාල් පාර ගෙපල්ලව හංදිය සිට වන පර්යේෂණ ආයතනය) | | රු 35,000.00 |
| | | | 01.අන්තර් කොට්ඨාශ වොලිබෝල් තරඟය පැවැත්වීම හා යෞවන සමාජ සඳහා ක්‍රීඩා උපකරණ ලබාදීමේ වැඩසටහන පැවැත්වීම. | උයන්දන කොට්ඨාශය<br>උයන්දන මහජන ක්‍රීඩාංගණය | 25,000.00 |
| 07 | 2025.09.21 | සහතික පත්‍ර ප්‍රදානය සහ සමාප්තිය | 01. වොලිබෝල් තරඟය, පුස්තකාල තරඟය සහතික පත්‍ර ප්‍රදානය | කුරුණෑගල ප්‍රාදේශීය සභාව<br>. | |
| | | | එකතුව | | රු.620,000.00 |

## තීරණ අංක : – 25

සභා බලප්‍රදේශයේ කටුපිටිය කොට්ඨාශය ආවරණය වන පරිදි 2025.08.29 දින ජංගම වැඩසටහනක් පැවැත්වීම සඳහා රු.43500.00 ක් වැය දැරීමට අනුමැතිය ඉල්ලා ප්‍රජා සංවර්ධන නිලධාරී විසින් ඉදිරිපත් කර ඇති වැය ඇස්තමේන්තුව සඳහා අනුමැතිය ඉල්ලා ඉදිරිපත් කර ඇති ලිපිය පිළිබඳව සලකා බැලීමෙන් අනතුරුව පහත සඳහන් වැය ඇස්තමේන්තුව අනුමත කිරීම සුදුසු බවට මුදල් හා ප්‍රතිපත්ති සැකසීමේ කාරක සභාව විසින් තීරණය කරන ලදි.

වියදම් ඇස්තමේන්තුව

| අනු අංක | වැඩ විස්තරය | ප්‍රමාණය | ඒකක වටිනාකම | එකතුව |
|---|---|---|---|---|
| 01 | ළමා මනෝ විද්‍යාව පිළිබඳ උපදේශන වැඩසටහන සඳහා සම්පත් දායකත්වය | පැය 03 | 2000.00 | 6000.00 |
| 02 | තනි වර්ණ පෝස්ටර් ඩුප්ලෝ A-3 | 40 | 100 | 4000.00 |

| | | | | |
|---|---|---|---|---|
| 03 | A 4½ අත් පත්‍රිකා | 350 | 7.00 | 2450.00 |
| 04 | බැනර් (8x5) | 01 | | 5500.00 |
| 05 | ප්ලෙක්ස් අලවන ගම් | 01 | 550.00 | 550.00 |
| 06 | 6x3 ප්‍රමාණයේ බැනර් | 08 | 3000.00 | 24000.00 |
| 07 | වෙනත් වැය දැරීම් | | | 1000.00 |
| | එකතුව | | | 43,500.00 |

තීරණ අංක :- 26

මාස්පොත ප්‍රාදේශීය ශාසනාරක්ෂක මණ්ඩලයේ ප්‍රධාන ලේඛකාධිකාරී පූජ්‍ය කොළොන්නාවේ රේවත හිමි විසින් 2025.09.14 දින පැවැත්වෙන ප්‍රාදේශීය සිසු නිපුනතා වාර්ෂික ත්‍යාග ප්‍රධානෝත්සවය සඳහා ආධාර මුදලක් ඉල්ලා ඉදිරිපත් කර ඇති ලිපිය පිළිබඳව සලකා බැලීමෙන් අනතුරුව මෙවැනි ඉල්ලීම් ගරු ආණ්ඩුකාර අනුමැතියට යොමු කලයුතු බැවින් මෙම ඉල්ලීම ක්‍රියාත්මක කිරීම සඳහා කාලය ප්‍රමාණවත් නොමැති බව දන්වා යැවීම සුදුසු බවට මුදල් හා ප්‍රතිපත්ති සැකසීමේ කාරක සභාව විසින් තීරණය කරන ලදි.

තීරණ අංක :- 27

ප්‍රාදේශීය සභාවෙන් කලයුතු මහගු සේවාවක් මෙන්ම සභාවට ආදායම් මාර්ගයක්ද ලෙස සලකා වැල්ලව කොට්ඨාශයේ ග්‍රාම නිලධාරී වසම් 06 ක් ආවරණය වන පරිදි පෙරපාසැලක් හා දිවාසුරකුම් මධ්‍යස්ථානයක් ප්‍රාදේශීය සභාව මගින් ඉදිකර පවත්වාගෙන යාම සඳහා ගරු මන්ත්‍රී එම්.ඒ.අයි.තුෂාර චන්ද්‍රසේන මහතා විසින් ඉදිරිපත් කරන ලද ලිපිය පිළිබඳව සලකා බැලීමෙන් අනතුරුව 2026 වර්ෂයේ අයවැය යෝජනාවක් වශයෙන් මෙම යෝජනාව ඉදිරිපත් කිරීම සුදුසු බවට මුදල් හා ප්‍රතිපත්ති සැකසීමේ කාරක සභාව විසින් තීරණය කරන ලදි.

තීරණ අංක :- 28

2025.08.15 දින පැවැති දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු රැස්වීමේ තීරණ දැනුම්දීම යටතේ මාර්ග සංවර්ධන අධිකාරියේ පළාත් භාර අධ්‍යක්ෂ විසින් අඹේපුස්ස-කුරුණෑගල-ත්‍රිකුණාමලය මාර්ගයේ (A006) (38+950-39+838 කිලෝමීටරයේ බඩගමුව රක්ෂිතය අසල මාර්ගය දෙපස ඉදිකර ඇති සංවර්ධිත ගිමන් හරින ප්‍රදේශයේ නඩත්තු කටයුතු තාවකාලිකව කුරුණෑගල ප්‍රාදේශීය සභාව වෙත පැවරීම සම්බන්ධව එවා ඇති ලිපිය කමිටුව වෙත ඉදිරිපත් කරන ලදුව ඒ පිළිබඳව සාකච්ඡා කිරීමෙන් අනතුරුව වසර 05ක කාල සීමාව තුළ ප්‍රාදේශීය සභාව හැර වෙනත් පාර්ශ්වයක් වෙත මෙම ව්‍යාපෘතිය පවත්වාගෙන යාමට

පැවරීමක් සිදුකරන්නේ නම් එකී පාර්ශ්වය විසින් ප්‍රාදේශීය සභාව වෙත මෙම ව්‍යාපෘතිය පවරාදෙනු ලැබූ දින සිට ප්‍රාදේශීය සභාව විසින් දරණු ලබන සියලුම වියදම් එකවර ප්‍රාදේශීය සභාව වෙත ගෙවිය යුතුය. තවද,වසර 05ක කාල සීමාව ඉක්මවීමෙන් පසුවද මෙම ව්‍යාපෘතියේ නඩත්තු කටයුතු පවත්වාගෙන යාමට වෙනත් පාර්ශ්වයක් වෙත පැවරීමක් සිදුකරන්නේ නම් එකී පාර්ශ්වය විසින්ද මෙම ව්‍යාපෘතිය සඳහා ප්‍රාදේශීය සභාව වෙත පවරා දෙනු ලැබූ දින සිට ප්‍රාදේශීය සභාව විසින් දරනු ලබන සියලුම වියදම් එකවර ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු ලෙසට සංශෝධනය විය යුතු බවට මුදල් හා ප්‍රතිපත්ති සැකසීමේ කාරක සභාව විසින් තීරණය කරන ලදි.

තීරණ අංක :- 29

කුරුණෑගල ප්‍රාදේශීය සභාවේ 186 ක් වන සියළුම නිලධාරීන් සහ සේවක මණ්ඩලය වෙනුවෙන් සේවක අභිප්‍රේරණ වැඩසටහනක් සිදු කිරීම සඳහා සහ ඒ සඳහා රු.279,350.00ක් වැය දැරීම සඳහා අනුමැතිය ඉල්ලා ප්‍රජා සංවර්ධන නිලධාරී විසින් ඉදිරිපත් කර ඇති වියදම් ඇස්තමේන්තුව පිළිබඳව සලකා බැලීමෙන් අනතුරුව පහත සඳහන් එම වියදම් ඇස්තමේන්තුව අනුමත කිරීම සුදුසු බවට මුදල් හා ප්‍රතිපත්ති සැකසීමේ කාරක සභාව විසින් තීරණය කරන ලදි.

<u>සේවක අභිප්‍රේරණ වැඩසටහන සඳහා වියදම් ඇස්තමේන්තුව-2025</u>

| අනු අංකය | ක්‍රියාකාරකම | ඒකකයක මිල | ප්‍රමාණය | වැයවන මුදල |
|---|---|---|---|---|
| 01 | සම්පත්දායක දීමනාව | 2400. | පැය 6 | 14,400.00 |
| 02 | සම්පත්දායක ගමන් වියදම | 12 | කි.මී 100 | 1200.00 |
| 03 | ගීත ගායනය හා වාදනය සඳහා | 5000.00 | 02 | 10000.00 |
| | වසරේහොඳම සේවකයා ඇගයීම | | | |
| 04 | කාර්ය මණ්ඩලය අතරින් එක් නිළධාරියෙක් | 1,500.00 | 01 | 1,500.00 |
| | සෞඛ්‍ය කම්කරු සේවකයින්ගෙන් එක් අයෙකු | 1,500.00 | 01 | 1,500.00 |
| | මාර්ග කම්කරු සේවකයින්ගෙන් එක් අයෙකු | 1,500.00 | 01 | 1,500.00 |
| | පුස්තකාල කාර්ය මණ්ඩලයේ එක් අයෙකු | 1,500.00 | 01 | 1,500.00 |
| | රියදුරු මහතුන්ගෙන් එක් අයෙකු | 1,500.00 | 01 | 1,500.00 |
| | මුර සේවයේ මහතුන්ගෙන් එක් අයෙකු | 1,500.00 | 01 | 1,500.00 |
| | | | | 9000.00 |
| 05 | උදෑසන කෙටි ආහාරය සමඟ තේ ( කාර්යය මණ්ඩලය හා මන්ත්‍රී මණ්ඩලය සඳහා) | 100.00 | 230 | 23,000.00 |

| | | | | |
|---|---|---|---|---|
| 06 | දිවා ආහාරය සඳහා | 500.00 | 230 | 115,000.00 |
| 07 | සේවක ඇගයීම සඳහා සුළු ත්‍යාග | 550 | 185 | 101,750.00 |
| 08 | වෙනත් කටයුතු | | | 5000.00 |
| එකතුව | | | | 279,350.00 |

තීරණ අංක :– 30

විල්බාව සායන මධ්‍යස්ථානයේ අළුත්වැඩියා කරන ලද ජල මෝටරය ස්ථාන ගත කිරීමට තාක්ෂණ නිලධාරී විසින් ලබාදී ඇති ඇස්තමේන්තුව කමිටුව වෙත ඉදිරිපත් කරන ලදුව රු.38228.49 ක් වූ වියදම් ඇස්තමේන්තුව සඳහා අනුමැතිය ලබාදීම සුදුසු බවට මුදල් හා ප්‍රතිපත්ති සැකසීමේ කාරක සභාව විසින් තීරණය කරන ලදි.

තීරණ අංක :– 31

සභාව සතු වත්කම් 2026 වර්ෂයට බදු ලබාදීම සඳහා අවම ලංසුව තීරණය කිරීමට පත් කර ඇති කමිටුව විසින් ලබාදී ඇති වාර්තාව පිළිබඳව සලකා බැලීමෙන් අනතුරුව සභා දේපල 2026 වර්ෂයට බදු ලබාදීමේ අවම ලංසුව තීරණය කිරීම සඳහා ඒ සඳහා පත් කල කමිටු නිලධාරීන්ට අමතරව ගරු උපසභාපති ජී.ඒ.චමිලා ප්‍රසාදිනී රත්නවර්ධන මිය, ගරු මන්ත්‍රී එම්.ඒ.අයි.තුෂාර චන්ද්‍රසේන මහතා, ගරු මන්ත්‍රී බී.එම්.එස්.එම්.මිත්‍රානන්ද මහතා, ගරු මන්ත්‍රී ඩී.එම්.එස්.හර්ෂණ මහතා, සහ ගරු මන්ත්‍රී එස්.ඩබ්.වයි.දුලිප් සිල්වා මහතාගෙන් සැදුම් ලත් කමිටුවක් පත් කරන ලද අතර එම කමිටුව 2026 වර්ෂයට වත්කම් බදු ලබාදීමේ අවම ලංසුව තීරණය කිරීම සම්බන්ධව සාකච්ජා කර තීරණයක් ගෙන එම තීරණය ඉදිරි මහ සභාවට ඉදිරිපත් කිරීම සුදුසු බවට මුදල් හා ප්‍රතිපත්ති සැකසීමේ කාරක සභාව විසින් තීරණය කරන ලදි.

තීරණ අංක :– 32

සභාව සතු PE-0150 දරණ කැබ්රථයේ අලුත්වැඩියා කටයුතු හා වාර සේවා කටයුතු ණය පදනම මත සිදුකරන නිෂ්පාදිත ආයතනය වන ටොයොටා ලංකා පුද්ගලික සමාගම විසින් එවා ඇති උපරිමය රු.1,000,000.00ණය සිමාව සඳහා වන ණයගිවිසුම් අයැදුම්පත කමිටුව වෙත ඉදිරිපත් කරන ලදුව ඒ සඳහා ගිවිසුම්ගත වීමේ අවශ්‍යතාවයක් නොමැති බවට මුදල් හා ප්‍රතිපත්ති සැකසීමේ කාරක සභාව විසින් තීරණය කරන ලදි.

තීරණ අංක :– 33

මරළුවාව සායන මධ්‍යස්ථානය සඳහා අලුතින් ජල සම්බන්ධතාවය ලබා ගැනීම සහ පවත්නා වැසිකිලිය අළුත්වැඩියා කිරීම සම්බන්ධව විෂයභාර නිලධාරී විසින් ඉදිරිපත් කරන ලද ලිපිය පිළිබඳව සලකා බැලීමෙන් අනතුරුව එම සායන මධ්‍යස්ථානය සඳහා ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය වෙතින් නව ජලසම්බන්ධතාවයක් ලබාගැනිමට සහ වැසිකිලිය අළුත්වැඩියා කිරීම සුදුසු බවට මුදල් හා ප්‍රතිපත්ති සැකසීමේ කාරක සභාව විසින් තීරණය කරන ලදි.

තීරණ අංක :- 34

2025.07.04 දින පැවැති එලදායිතා පුහුණු වැඩසටහනේ සංග්‍රහ වියදම් සඳහා සකස් කරන ලද වියදම් ඇස්තමේන්තුවට අනුව අනුමත මුදල රු.25,240.00 ක් වන නමුත් සත්‍ය වියදම රු.29,920.00 ක් වූ බැවින් විෂයභාර නිලධාරී විසින් ඉදිරිපත් කරන ලද එම සංශෝධිත ඇස්තමේන්තුව අනුමත කිරීම සුදුසු බවට මුදල් හා ප්‍රතිපත්ති සැකසීමේ කාරක සභාව විසින් තීරණය කරන ලදි.

තීරණ අංක :- 35

2024 වැසිකිලි ආධාර ලබාදීමේ වැඩසටහන යටතේ තෙවන අදියරට අදාලව වැසිකිලියේ වැඩ නිම කල ප්‍රතිලාභියෙකුට රු. 15000.00 ක මුදල ලබාදිම සඳහා නිර්දේශ කරමින් විෂයභාර නිලධාරී විසින් ඉදිරිපත් කරන ලද ක්ෂේත්‍ර පරීක්ෂණ වාර්තාව පිළිබඳව සලකා බැලීමෙන් අනතුරුව එම මුදල ලබාදීම සුදුසු බවට මුදල් හා ප්‍රතිපත්ති සැකසීමේ කාරක සභාව විසින් තීරණය කරන ලදි.

තීරණ අංක :- 36

සභාවේ 2025 අයවැයෙන් වෙන් කල ප්‍රතිපාදන පහත වැඩසටහන් සඳහා ප්‍රමාණවත් නොවූ බැවින් වැයශීර්ෂ මාරුවක් මගින් මුදල් මාරු කිරීම සඳහා අනුමැතිය ඉල්ලා විෂය භාර නිලධාරී විසින් ඉදිරිපත් කර ඇති ලිපිය පිළිබඳව සලකා බැලීමෙන් අනතුරුව පහත පරිදි වැයශීර්ෂ මාරු කිරීම සඳහා අනුමැතිය ලබාදීම සුදුසු බවට මුදල් හා ප්‍රතිපත්ති සැකසීමේ කාරක සභාව විසින් තීරණය කරන ලදි.

503-4 තැනිම් ද්‍රව්‍ය සහ වීථි පහන්

101-9 වෙනත් දීමනා

203-2-2 ආදාහනාගාර ගෑස් සඳහා

109-1 කාර්යාල උපකරණ හා ලී බඩු මිලට ගැනිම

තීරණ අංක :- 37

2025.08.27 දින බොරළු සඳහා ටෙන්ඩර් මණ්ඩලය වෙත ඉදිරිපත් කරන ලද විවෘත මිලගණන් සම්බන්ධ තාක්ෂණික ඇගයීම් වාර්තාව විෂයභාර නිලධාරී විසින් ඉදිරිපත් කරන ලදුව ඒ පිළිබඳව සලකා බැලීමෙන් අනතුරුව වාර්තාවට අනුව අවම මිලගණන් ඉදිරිපත් කර ඇති ප්‍රසාද් සප්ලයර්ස් වෙතින් සභාවේ මාර්ග සංවර්ධන කටයුතු සඳහා බොරළු සපයා ගැනීම සුදුසු බවට මුදල් හා ප්‍රතිපත්ති සැකසීමේ කාරක සභාව විසින් තීරණය කරන ලදි.

තීරණ අංක :- 38

පහත නම් සඳහන් වාහන අළුත්වැඩියා කිරීම සඳහා 2025.08.05 දින ටෙන්ඩර් මණ්ඩලය සඳහා ඉදිරිපත් කරන ලද මිලගණන් සම්බන්ධ තාක්ෂණ ඇගයීම් වාර්තාව විෂයභාර නිලධාරී විසින් ඉදිරිපත් කරන ලදුව එම වාහන අළුත්වැඩියා කටයුතු සඳහා මිලගණන් ලැබී ඇත්තේ එක් ආයතනයකින් පමණක් බැවින් නැවත විවෘත මිලගණන් යටතේ මිලගණන් කැඳවීමට කටයුතු කිරීම සුදුසු බවට මුදල් හා ප්‍රතිපත්ති සැකසීමේ කාරක සභාව විසින් තීරණය කරන ලදි.

01. **PE-0150** දරණ කැබ් රථය
02. **NWRV-4257**දරණ ට්‍රැක්ටර් ටේලරය
03. **GD-8981** දරණ ට්‍රැක්ටර් රථයේ **RX-5567**දරණ ටේලරයේ තට්ටුව සහ පිටුපස දොර අළුත්වැඩියා කිරීම

තීරණ අංක :- 39

2025 අලුතින් තේරී පත්වූ ප්‍රාදේශීය සභා මන්ත්‍රී මණ්ඩලයට හැඳුනුම්පත් සකස් කිරීම සඳහා මිලගණන් කැඳවීමේදී එක් මිලගණනක් පමණක් ලැබී ඇති නිසාත් එම මිලගණනද වෙළඳපලේ සාමාන්‍ය මිලගණන් වලට සාපේක්ෂව ඉතා ඉහල මිලගණනක් වන නිසාත් නැවත විවෘත මිලගණන් යටතේ මිලගණන් කැඳවීමට කටයුතු කිරීම සුදුසු බවට මුදල් හා ප්‍රතිපත්ති සැකසීමේ කාරක සභාව විසින් තීරණය කරන ලදි.

තීරණ අංක :- 40

කුරුණෑගල ප්‍රාදේශීය සභාවේ කණිෂ්ඨ කාර්යමණ්ඩලය විසින් ඔවුන් අනියම් පදනම මත සේවය කරන කාලයේ වැටුපෙන් කපා හරින ලද EPF, ETF මුදල් සම්බන්ධව විමසා ඉදිරිපත් කර ඇති ලිපිය පිළිබඳව සලකා බැලීමෙන් අනතුරුව ඒ සම්බන්ධව විස්තරාත්මක වාර්තාවක් ඊලග මුදල් කමිටුව වෙත ලබාදෙන ලෙස වැටුප් විෂයභාර නිලධාරීවෙත දැන්වීම සුදුසු බවට මුදල් හා ප්‍රතිපත්ති සැකසීමේ කාරක සභාව විසින් තීරණය කරන ලදි.

තීරණ අංක :– 41

ප්‍රදේශීය සභා මන්ත්‍රී චන්දිම ජයවිලාල් බණ්ඩාර මහතා විසින් මාර්ග 02 ක් තාර හෝ කොන්ක්‍රීට් යොදා ප්‍රතිසංස්කරණය කර දෙන ලෙස ඉල්ලා ඉදිරිපත් කර ඇති ලිපිය පිළිබඳව සලකා බැලීමෙන් අනතුරුව පහත නම් සඳහන් මාර්ග මේ වසරේ ප්‍රතිපාදන මත සංවර්ධනය කිරීමටත් ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවේ නම් දෙවැනියට සඳහන් මාර්ගය 2026 වසරේ සංවර්ධන යෝජනා වලට ඇතුලත් කිරීමටත් සුදුසු බවට මුදල් හා ප්‍රතිපත්ති සැකසීමේ කාරක සභාව විසින් තීරණය කරන ලදි.

01. තිස්නම්පොල තිබ්බටුපිටිය ගම් යාවන අතුරු මාර්ගය
02. තිස්නම්පොල ප්‍රධාන පාරෙන් මඤ්ඤොක්ක වත්ත ප්‍රදේශය දක්වා ඇති අතුරු මාර්ගය

තීරණ අංක :- 42

ප්‍රාදේශිය ලේකම් කාර්යාලය මහින් ප්‍රාදේශිය සම්බන්ධීකරණ කමිටු, දැනුම් දීම යටතේ එවා ඇති ලිපියට අනුව 2025 වර්ෂයේ මල්ලවපිටිය ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසයේ විමධ්‍යගත අයවැය වැඩසටහන යටතේ ක්‍රියත්මක කිරිමට අනුමත වි ඇති උඩගම ග්‍රාම නිලධාරි වසමේ කුරුදුපිටිය සිට මැද්දේගම පන්සල අසලට යන මාර්ගය සංවර්ධනය කිරිමට ලබාදී ඇති ඇස්තමේන්තුව අනුව මාර්ගය සංවර්ධනය කර,එම මාර්ගයේ පැති බැම්ම ප්‍රාදේශිය සභා අරමුදලින් ඉදිකිරිමට සුදුසු බව සම්බන්ධිකරණ කමිටුවේ දි තිරණය කර ඇති බව දන්වා එවා ඇති ලිපිය කාරක සභාවට ඉදිරිපත් කිරිමේන් අනතුරුව ඒ සම්බන්ධව සාකච්ජා කිරිමේන් පසු සභා අරමුදලින් පැතිබැම්ම ඉදි කිරිම සුදුසු බවට මුදල් හා ප්‍රතිපත්ති සැකසීමේ කාරක සභාව විසින් තීරණය කරන ලදි.

| | |
|---|---|
| .............................. | ............................ |
| සකස් කලේ, | අනුමත කලේ, |
| සංවර්ධන නිලධාරි, | සභාපති, |